# 15 මූල්‍ය කළමනාකරණය.

## මූල්‍ය කළමනාකරණය යනු,

ව්‍යාපාර ආයතනයකට තම ව්‍යාපාර කටයුතු ඵලදායීව පවත්වාගෙන යාමට අරමුදල් අතයාවශය වේ.එබැවින් ව්‍යාපාර ආයතනය වලට අවශ්‍ය අරමුදල් යෝග්‍ය මාර්ග වලින් සපයා ගැනීම හා එම අරමුදල් ඵලදායි ලෙස ව්‍යාපාර කටයුතුවල ආයෝජන කරමින් අයිතිකරුවන්ගේ ලාබය උපරිම කිරීමේ සියලු කටයුතු මූල්‍ය කළමනාකරණය ලෙස හැඳින්වේ.

**<u>මූල්‍ය කළමනාකරණයේ පරමාර්ථ.</u>**

මූල්‍ය කළමනාකරණයේ මූලික පරමාර්ථ.

ව්‍යාපාරයේ හිමිකරුවන්ගේ ව්‍යාපාරය හා සබැඳි අගය උපරිම කිරීමයි.

උදාහරණ :

■ සමාගමක අයිතිකරුවන් වන්නේ එහි සිටින කොටස්කරුවන්ය. එනම් සමාගමක අගය නැතහොත් වටිනාකම වැඩිවන විට එම සමාගමේ කොටස් වල මිල ඉහළ යයි.ඒ අනුව සමාගමක කොටස්වල මිල ඉහළ යාමෙන් පෙන්නුම් කරන්නේ අයිතිකරුවන්ගේ දනය ඉහළ යාමයි.

■ කේවල ස්වාමි ව්‍යාපාරයක අගය නැතහොත් දනය ඉහල යාම යනුවෙන් පෙන්විය හැක්කේ එම ව්‍යාපාරය ඉහළ වටිනාකමකට අලෙවි කළ හැකි බවය.

මූල්‍ය කළමනාකරණයේ සෙසු පරමාර්ථ.

ඉහත සඳහන් කල මූලික පරමාර්ථ වලට අමතරව මූල්‍ය කළමණාරණයේ සෙසු පරමාර්ථ දක්නට ලැබේ.

■ ලාබය උපරිම කිරිම

ව්‍යාපාරයේ ආදායම හා පිරිවැය අතර පරතරය උපරිම කිරීමයි.

■ කොටසක ඉපයීම උපරිම කිරීම

සාමාන්‍ය කොටස් වෙනුවෙන් උපයන ලද මුදල හැකි පමණ උපරිම කිරීමයි.

- දිගුකාලීන මූල්‍ය ස්ථාවරත්වය තහවුරු කිරීම.
- මුදල් බාවිතය අවම කිරීම .
- මූල්‍ය අවදානම පාලනය

මූල්‍ය කළමනාකරණයෙන් වැදගත් තීරණ දෙකකට එළඹිය හැකිය.

- ආයෝජන තීරණ
- මූල්‍යන තීරණ

**ආයෝජන තීරණ**

අරමුදල් ජංගම හා ස්ථාවර වත්කම් වල යෙදවීම පිළිබඳව ගනු ලබන තීරණ.

දිගුකාලීන

- ව්‍යාපාරය නවීකරණය පිලිබඳ තීරණ
- නැවත ස්ථාපනය කිරීම පිලිබඳ තීරණ
- ව්‍යාපාර වැඩිදියුණු කිරීම පිලිබඳ
- ව්‍යාපාර විවිධාංගීකරණය පිලිබඳ

කෙටිකාලීන

- වෙළෙඳ තොග පිලිබඳ තීරණ
- ණයගැතියන් පිලිබඳ තීරණ
- මුදල් කළමනාකරණය පිලිබඳ තීරණ
- වෙනත් කෙටිකාලීන තීරණ පිලිබඳ

**මූල්‍යන තීරණ**

ජංගම හා ස්ථාවර වත්කම් වල ආයෝජනය කිරීම සඳහා අවශ්‍ය අරමුදල් සපයාගන්නේ කෙසේද යන්න පිලිබඳව ගනු ලබන තීරණයන් වේ.මෙය ශේෂ පත්‍රයේ වත්කම් පැත්ත තුළින් පෙන්නුම් කරනු ලැබේ.

දිගුකාලීන

ප්‍රාග්ධන ව්‍යුහය

- ණය ප්‍රාග්ධනය ලබා ගැනීම පිලිබඳ තීරණ
- හිමිකම් ප්‍රාග්ධන රැස් කරගැනීම පිලිබඳ තීරණ
- ණය හා හිමිකම් ප්‍රාග්ධන අනුපාත පිලිබඳ

ලාබාංශ පිලිබඳව

- රඳවාගැනීම් පිලිබඳ
- ලාබාංශ විබජනය පිලිබඳ තීරණ

කෙටිකාලීන

- වෙළෙඳ ණයහිමියන් පිලිබඳ
- බැංකු අයිරා හා අනෙකුත් කෙටිකාලීන බැංකු ණය පිලිබඳ තීරණ.
- උපචිත වියදම් පිලිබඳ තීරණ

**මූල්‍ය සැලසුම්කරණය හා පාලනය .**

ව්‍යාපාරයක මූල්‍ය කළමනාකරණ තීරණ ක්‍රියාත්මක කිරීමේදී සිදු කරන ලබන කාර්‍යයන් දෙකක් වන්නේ,

1. මූල්‍ය සැලසුම්කරණය
2. මූල්‍ය පාලනය

ඒ අනුව මූල්‍ය සැලසුම්කරණය සඳහා මුදල් අයවැය ලේඛනය සහ ප්‍රාග්ධන අයවැයකරණයත් ,මූලය පාලනය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශත් උපයෝගී කරගනු ලැබේ.

මුදල් අයවැය ලේඛනය

අපේක්ෂිත අනාගත කාලපරිච්ඡේදයකින් මුදල් ලැබීම් හා මුදල් ගෙවීම් සැලකිල්ලට ගෙන පිළියෙල කරනු ලබන ලේඛනය මුදල් අයවැය ලේඛනය වේ.

සැලසුම්කරණයේදී හා තීරණ ගැනීමේදී බාවිතයට ගනු ලබන අභ්‍යන්තර මූල්‍ය ඇස්තමේන්තුවක් ලෙස මුදල් අයවැය ලේඛනය හඳුන්වාදිය හැක. මෙහි අපේක්ෂිත මුදල් ලැබීම් මාර්ගද, අපේක්ෂිත මුදල් ගෙවීම් මාර්ගද සඳහන් කරනු ලබයි.

උදාහරණ : **අපේක්ෂිත මුදල් ලැබීම් මාර්ග**

- අතිපිට විකුණුම්
- වත්කම් විකුණුම්
- ණයගැති ලැබීම්

**අපේක්ෂිත මුදල් ගෙවීම්**

- තොග මිලට ගැනීම
- වැටුප් හා වේතන ගෙවීම්
- ණයහිමි ගෙවීම්
- ජංගම නොවන වත්කම් මිලට ගැනීම්

මුදල් අයවැය ලේඛනයක් පිළියෙල කිරීම තුලින් ව්‍යාපාරයට ලැබෙන ප්‍රතිලාභ

- අනාගතයේදී මුදල් අතිරික්තයක් වේනම් එය කල්තබා දැනගත හැකිවීමෙන් එම මුදල් ඵලදායීව ආයෝජනය කල හැකි වීම.
- අනාගතයේදී මුදල් ඌණතාවයක් වේ නම් එය කල්තබා දැනගෙන එයට මුහුණ දීමට හැකි වීම.
- සත්‍ය මුදල් ක්‍රියාකාරීත්වය හා සැසදීම මගින් මුදල් පිලිබඳ සැලසුම්කරණය හා පාලනය පහසු වීම.

## ප්‍රාග්ධන අයවැයකරණය

ඉදිරි අනාගතයේදී ප්‍රතිලාභ ඉවයීමේ අරමුනින් ව්‍යාපාර ආයතනයක් සතුව පවතින වර්තමාන අරමුදල් වඩාත් ඵලදායි ලෙස දිගුකාලීන වත්කම් වල හෝ දිගුකාලීන ව්‍යාපෘති වල ආයෝජන කිරීමට සැලසුම් කිරීම ප්‍රාග්ධන අයවැයකරණය නම් වේ.

මූල්‍ය කළමනාකරණය ගනු ලබන ප්‍රාග්ධන අයවැයකරණ තීරණ දිගුකාලීන ආයෝජන තීරණ ලෙස හැඳින්වේ.

උදාහරණ :

- ව්‍යාපාර කටයුතු වර්දනය සඳහා නව ගොඩනැගිල්ලක් ඉදි කිරීම
- නව යන්ත්‍රයක් මිලට ගැනීම
- ප්‍රචාරන වැඩසටහන් සදහා වැයකරන දිගුකාලීන වියදම්

මුදල් ප්‍රවාහ ප්‍රකාශය

ආයතනයකට මුදල් ගලා ඒම සිදු වූ ආකාරය හා එඅම මුදල් ගලා යාම සිදු වූ ආකාරය විශ්ලේෂණය කර දැක්වීම මුදල් ප්‍රවාහ ප්‍රකාශයකි. මෙහි මුදල් ඔරවාහය නම් මුදල් ලැබීම් හා ගෙවීම් මාර්ගයකි.

ව්‍යාපාරයක අරමුදල් අවශ්‍යතා

ව්‍යාපාරයක අරමුදල් අවශ්‍යතා ප්‍රදාන කොටස් දෙකකි.

1. කෙටිකාලීන මූල්‍ය අවශ්‍යතා
2. දිගුකාලීන මූල්‍ය අවශ්‍යතා

1. කෙටිකාලීන මූල්‍ය අවශ්‍යතා

කාටක ප්‍රාග්ධන අවශ්‍යතා

එදිනෙදා ව්‍යාපාර කටයුතු පවතිවාගෙන යාම සඳහා අවශ්‍ය වන අරමුදල් කාරක ප්‍රාග්ධන අවශ්‍යතා වේ. මෙහි ප්‍රදාන ස්වරූප දෙකකි.

1. දළ කාරක ප්‍රාග්ධන

මෙය ව්‍යාපාරයේ මුලු ජංගම වත්කම් වල වටිනාකම වේ.

2. ශුදධ කාරක ප්‍රාග්ධනය

මෙය ජංගම වත්කම් හා ජංගම වගකීම් අතර වෙනස වේ.

එනම්,

ශුදධ කාරක ප්‍රාග්ධන ̧ ජංගම වත්කම් * ජංගම වගකීම්

අවශ්‍ය කාරක ප්‍රාග්ධන ප්‍රමාණය තීරණය කරන සාදක.

- ව්‍යාපාරයේ ප්‍රමාණය හා ස්වභාවය
- ව්‍යාපාරයේ රදවා ගතයුතු තොග මට්ටම්
- ක්‍රියාත්මක කිරීමට අදහස් කර ඇති පර්යේෂණ හා සංවර්ධන ව්‍යාපෘති.
- ව්‍යාපාරය සඳහා යොදාගන්නා තාක්ෂණය
- සැපයුම්කරුවන්ගේ ණය කොන්දේසි
- ගණුදෙනුකරුවන්ට ණය ලබා දීමේදී ක්‍රියාත්මක කරන ණය කොන්දේසි
- ඉල්ලුමේ ස්වභාවය

ප්‍රමාණවත් කාරක ප්‍රාග්ධනයක් නොමැති වීමෙන් මුහුනපෑමට සිදුවන ගැටලු

- ව්‍යාපාරයේ වර්ධනය ඇණ හිටීම
- සැලසුම් ක්‍රියාත්මක කල නොහැකි වීම
- ස්ථාවර වත්කම් භාවිතයට ගත නොහැකි වීම
- ආකර්ෂණීය ණය ලබා ගැනීමේ අවස්ථා ඇහිරී යාම
- කෙටිකාලීන වගකීම් බේරුම් කිරීමට නොහැකි වීමෙන් කීර්තිනාමය පලුදු වීම

කාරක ප්‍රාග්ධන ගැටලු වලට මුහුනදීමට ගතයුතු ක්‍රියාමාර්ග

- අතිපිට විකුණුම් වැඩිකිරීම
- අතිරේක තොග අලෙවිය
- අතිරේක ස්ථාවර වත්කම් අලෙවිය
- කල්බදු ක්‍රමයට අවශ්‍ය වත්කම් ලබාගැනීම
- අත්‍යවශ්‍ය මිලදී ගැනීම් පමනක් සිදු කිරීම
- සැපයුම්කරුවන් ලවා ණය සහන කාලය දීර්ඝ කරවා ගැනීම

ද්‍රවශීලතාවය හා ලාභදායිත්වය අතර පවතින සම්බන්ධතාවය.

ව්‍යාපාරයක එදිනෙදා පවතින වගකීම් පියවීමට මුහුණදීමට මුහුණ දීමට ඇති ශක්තිය ද්‍රවශීලතාවය නම් වේ ඒ සඳහා අරමුදල් ළඟ තබා ගත යුතුය.

සෑම ව්‍යාපාරයකටම පවතින මුදලෙහි පිරිවැයත් එම පිරිවැය ආවරණය කර ගැනීමට නම් අගැනීමට නම් අරමුදල් විවිධ ව්‍යාපෘතිවල ආයෝජනය කළ යුතුය . මේ අනුව මූල්‍ය කළමනාකරුවෙකු ලාභ ඉපයීම සඳහා අරමුදල් විවිධ ව්‍යාපෘති වල ව්‍යාපෘතිවල ආයෝජනය කළ විට ද්‍රවශීලතාවය පිරිහෙන අතර ම දුර ද්‍රවශීලතා ආරක්ෂා කරගැනීම සඳහා මුදල් ළඟ තබා ගත් විට ලාභ නොමැති වේ.

එසේම අරමුදල් ආයෝජනය කිරීමේදී ද මූල්‍ය කළමනාකරුවෙකුට මුහුණදීමට සිදුවෙන ගැටලුවක් වන්නේ,ද්‍රවශීලතාවය අඩු වත්කම්වල ලාභදායිතා වැඩිවීමත් ,ද්‍රවශිලතා වැඩි වත්කම් වල ලාභදායිත්වය අඩු වීමත්ය

2. දිගු කාලීන මූල්‍ය අවශ්‍යතා

ව්‍යාපාරයක විවිධ තිබූ දිගුකාලීන ව්‍යාපෘති නැතහොත් ස්ථාවර වත්කම් වත්කම් දිවීම සඳහා අවශ්‍ය වීම දිගුකාලීන අරමුදල් අවශ්‍යතා නම් වේ .

උදාහරණ:

ඉඩම් හා ගොඩනැගිලි

යන්ත්‍රෝපකරණ

රථ වාහන

කාර්යාල උපකරණ මිලදී ගැනීම සඳහා

## ව්‍යාපාරයක මූලික මූල්‍ය අවශ්‍යතා

ව්‍යාපාරයක කාරක ප්‍රාග්ධන අවශ්‍යතා හා දිගුකාලීන මුදල් අවශ්‍යතාවන් යන දෙකම සැලකිල්ලට ගෙන මූලික වශයෙන් අරමුදල් අවශ්‍ය වන අවස්ථා පහක් පෙන්විය හැකිය.

1. ආරම්භ කටයුතු සඳහා

ව්යාපාරයක් මූලික වශයෙන් ලියාපදිංචි කිරීම ඇතුළු ආරම්භ කිරීමේදී වැය වැය වන වත්කම් මිලදී ගැනීම සඳහා අවශ්‍ය වන අරමුදල් මින් අදහස් වේ .

2. කාරක ප්‍රාග්ධන අවශ්‍යතා

3. වර්ධනය සඳහා

ව්‍යාපාරයක් ආරම්භ කොට පවත්වාගෙන යාමේදී තවදුරටත් වර්ධනය කරලීමට අතිරේක අරමුදල් අවශ්‍ය වන අවස්ථා ඇත.

4. ව්‍යාපාර අවපාත වලට මුහුණ දීමට.

ව්‍යාපාරයක් පවත්වාගෙන යාමේදී අලාභ ලබන තත්ත්වයන් හැකි විය හැකි අතර,එම තත්ත්වයන්ගෙන් මිදී ලාභ ලබන තත්ත්වයට පරිවර්තනය වීමට අතිරේක අරමුදල් අවශ්‍ය වේ.

5. අත්පත් කර ගැනීම හෝ මිලදී ගැනීම සඳහා .

ව්‍යාපාර අතර තරගකාරීත්වය දැඩිව පවතින විට,එහි තරගකාරී ව්‍යාපාර මිලදී ගැනීම තුළින් වෙළඳපොළ තුළ ස්වාධීනත්වය ඇතිකර ගැනීමට අරමුදල් අවශ්‍ය වීමයි.

## ව්‍යාපාරයක අරමුදල් සම්පාදන මාර්ග.

ව්‍යාපාරයක අරමුදල් සම්පාදන මාර්ග රාශියක් පවතින අතර ඒවා මූලික වශයෙන් පදනම් හතරක් යටතේ බෙදා වෙන්කර හැකිය .

- ප්‍රභවය /මූලාශ්‍රය අනුව
- කාලය අනුව
- ප්‍රවාහන අනුව
- හිමිකාරීත්වය අනුව

## ප්‍රභවය /මූලාශ්‍රය අනුව සම්පාදන මාර්ග.

ව්‍යාපාරයකට අරමුදල් ජනනය වූ ආකාරය අනුව ප්‍රභවය හෙවත් මූලාශ්‍රය අනුව සම්පාදන මාර්ග ප්‍රධාන කොටස් දෙකකි.

1. අභ්‍යන්තර සම්පාදන මාර්ග

2. බාහිර සම්පාදන මාර්ග

අභ්‍යන්තර සම්පාදන මාර්ග.

ව්‍යාපාර ආයතනය තුළින් අවශ්‍ය අරමුදල් සම්පාදනය කර ගැනීම අභ්‍යන්තර සම්පාදන මාර්ග වේ .

උදාහරණ:

- රඳවාගත් ලාභ.
- ක්ෂය වෙන්කිරීම්
- වත්කම් අලෙවි කිරීම
- ආයෝජන උපලබ්දි කිරීම

අභ්‍යන්තර සම්පාදන මාර්ග වල වාසි

- පහසුවෙන් අරමුදල් රැස්කර රැස් කරගත හැකි වීම
- අරමුදල් සම්පාදනය කර ගැනීමේ පිරිවැයක් නොමැතිවීම
- ආපසු ගෙවීම් කිරීම පිළිබඳව පිළිබඳව බැඳියාවක් නොමැතිවීම

අභ්‍යන්තර සම්පාදන මාර්ග වල අවාසි

■ වැඩි මුදලක් රැස්කර ගත නොහැකි වීම

■ වත්කම් විකිණීම වැනි ක්‍රියාමාර්ග තුළින් තුළින් ව්‍යාපාරය පැවැත්මට අහිතකර ලෙස බලපෑම් කිරීම

බාහිර සම්පාදන මාර්ග

ව්‍යාපාරය පිටස්තර වූ මාර්ගයන්ගෙන් අරමුදල් සම්පාදනය කර ගැනීම බාහිර සම්පාදන මාර්ග වේ.

උදාහරණ:

■ කොටස් නිකුතුව

■ ණයකර නිකුතුව

■ බැංකු ණය

■ කුලී පිට ගැනුම්

■ වාණිජ පත්‍රිකා

බාහිර සම්පාදන මාර්ග වල වාසි

■ අරමුදල් සම්පාදන මාර්ග රාශියක් තිබීම .

■ වැඩි මුදලක් රැස්කර ගත හැකි වීම

■ අවශ්‍යතාවය මත යෝග්‍ය සම්පාදන මාර්ගයක් තෝරා ගත හැකි වීම.

බාහිර සම්පාදන මාර්ග වල අවාසි

■ සම්පාදනය කර ගැනීමේ ක්‍රියාවලිය සංකීර්ණ වීම

■ ඇප සුරැකුම්පත් ඉදිරිපත් කළ යුතු වීම

■ ආපසු ගෙවීම් කිරීම පිළිබඳ බැඳියාවක් පැවතීම

■ ව්‍යාපාරය වත්කම් හා දේපොල දේපළ ඇප සුරක්ෂිත කිරීමට සිදුවීම

■ පවත්වාගෙන යාමේදී අරමුදල් සම්පාදනය කර ගැනීමේදී පිරිවැයක් දැරීම

## කාලය අනුව සම්පාදන මාර්ග.

කාලය අනුව සැලකිල්ලට ගෙන අරමුදල් සම්පාදන මාර්ග කොටස් දෙකකි.

1. කෙටිකාලීන සම්පාදන මාර්ග
2. දිගුකාලීන සම්පාදන මාර්ග

කෙටිකාලීන සම්පාදන මාර්ග

වසරකට වඩා අඩු කාල පරිච්ඡේදයක් සඳහා අවශ්‍ය අරමුදල් සම්පාදනය කර ගැනීම වේ.

උදාහරණ:

- වාණිජ පත්‍රිකා
- බැංකු අයිරා
- වෙළඳ ණය
- ගෙවිය යුතු වියදම් සීමා කිරීම.

දිගුකාලීන සම්පාදන මාර්ග

වසරකට වඩා වැඩි කාල කාල පරිච්ඡේදයක් වෙනුවෙන් අරමුදල් සම්පාදනය කර ගැනීම වේ.

උදාහරණ:

- කොටස් නිකුතුව
- ණයකර නිකුතුව
- කැඳවාගත් ලාභ
- ක්ෂය වෙන්කිරීම්
- කල්බදු පහසුකම්
- බැංකුව ණය

## ප්‍රවාහය අනුව සම්පාදන මාර්ග.

ව්‍යාපාරයකට අරමුදල් ගලා යෑමේ ස්වභාවය පදනම් කරගැනීම ප්‍රවාහය අනුව සම්පාදන මාර්ග නම් වේ .

ඒ අනුව ප්‍රධාන කොටස් දෙකක් දක්නට ලැබේ.

1. සෘජු මාර්ග.
2. වක්‍ර මාර්ග

සෘජු මාර්ග

මූල්‍ය අතරමැදියන් සම්බන්ධ කර නොගෙන ව්‍යාපාරය විසින් ම විසින් ම අවශ්‍ය අරමුදල් සම්පාදනය කර ගැනීම වේ.

- රඳවාගත් ලාභ
- ක්ෂය සඳහා වෙන් කිරීම්
- කොටස් නිකුතුව
- ණයකර නිකුතුව
- වාණිජ පත්‍රිකා

වක්‍ර මාර්ග.

මූල්‍ය අතරමැදියන් සම්බන්ධ වෙමින් අරමුදල් සම්පාදනය කිරීම වක්‍ර මාර්ග වේ .එහිදී ආයෝජකයා සහ ණය ලබන්නා සෘජුවම සම්මුඛ නොවේ .

- කල්බදු
- බැංකු අයිරාව
- කුලීපිට ගැනුම්
- බැංකු ණය
- වෙළඳ ණය

හිමිකාරිත්වය අනුව සම්පාදන මාර්ග.

අරමුදල් සම්පාදන මාර්ගයේ පවතින අයිතිය පදනම් කරගෙන අරමුදල් සම්පාදන මාර්ග වලට බෙදා වෙන් කිරීම මින් අදහස් කෙරේ.

මේ අනුව ප්‍රධාන වශයෙන් අරමුදල් සම්පාදන මාර්ග දෙකක් දැකිය හැකිය.

- හිමිකාරත්ව මූල්‍යනය
- ණය මූල්‍යනය

හිමිකාරත්ව මූල්‍යනය

අයිතිකරුවන්ගේ ප්‍රාග්ධනය වැඩිකර ගැනීම තුළින් අවශ්‍ය අරමුදල් සම්පාදනය කර ගැනීම හිමිකාරත්ව මූල්‍යනය යි.

උදාහරණ :

- සාමාන්‍ය කොටස්
- රඳවාගත් ලාභ

**ණය මූල්‍යනය**

ව්‍යාපාරයෙන් පිටස්තර බාහිර මාර්ගයන්ගෙන් අරමුදල් සම්පාදනය කර ගැනීමයි.

- වරණීය කොටස්
- ණයකර
- දිගුකාලීන බැංකු ණය

**දෙමුහුම් මූල්‍යනය.**

හිමිකරුවන්ගේ ප්‍රාග්ධන ලක්ෂණ හා ණය ප්‍රාග්ධන ලක්ෂණ දෙකම සහිත මූල්‍ය සම්පාදන මාර්ග නම් වේ .

උදාහරණ :

පරිවර්තන්‍ය ණය.

මූල්‍ය අවශ්‍යතා සපුරා ගැනීම ගැනීමේදී සැලකිලිමත් විය යුතු කරුණු .

- අවශ්‍ය අරමුදල් ප්‍රමාණය
- අරමුදල් අවශ්‍ය වන කාලය

- පිරිවැය
- ව්‍යාපාර සංවිධානයේ ස්වභාවය
- ලැබිය යුතු ඇප සුරකුම්පත් පිළිබඳ තත්ත්වය
- ව්‍යාපාරය ප්‍රාග්ධන ව්‍යුහයට වෙන බලපෑම
- අරමුදල් යොදවන ව්‍යාපෘතියේ ස්වභාවය සහ ඉන් අපේක්ෂිත ප්‍රතිලාභ
- ව්‍යාපාරයේ කළමනාකරණයට වන බලපෑම

**මූල්‍ය කළමනාකරුගේ කාර්යභාරය.**

- මූල්‍ය අවශ්‍යතා පුරෝකතනය
- අවශ්‍ය ප්‍රාග්ධනය රැස් කර ගැනීම
- අරමුදල් ආයෝජනය කිරීම
- අරමුදල් කළමනාකරණය
- අනෙකුත් දෙපාර්තමේන්තු සමග සමඟ සම්බන්ධතා පවත්වාගෙන යෑම

**මූල්‍ය විශ්ලේෂණය.**

මූල්‍ය කලමනාකරු ව්‍යාපාරයෙන් මූල්‍ය තත්ත්වය කුමන ස්වරූපයෙන් පවතින්නේ ද යන්න පිළිබඳව දැනගැනීම සඳහා සිදුකරනු ලබන ක්‍රියාවලිය මූල්‍ය විශ්ලේෂණය නම් වේ .

මූල්‍ය විශ්ලේෂණය සඳහා භාවිතා කරන ප්‍රධාන ශිල්ප ක්‍රම දෙකක් පවතී

1. මූල්‍ය ප්‍රකාශ
2. මූල්‍ය අනුපාත

**මූල්‍ය ප්‍රකාශන**

මූල්‍ය කළමනාකරණයේ දී අවශ්‍ය වන තොරතුරු ලබා ගැනීම සඳහා ලබා ගැනීම සඳහා මූල්‍ය මූල්‍ය ප්‍රකාශ හෙවත් මූල්‍ය වාර්තා උපයෝගී කර ගනී.ඒ අනුව පිළියෙල කරන ලබන මූල්‍ය වාර්තා තුනක් පවතී.

1. ආදායම් ප්‍රකාශය

2. ශේෂ පත්‍රය

3. මුදල් ප්‍රවාහ ප්‍රකාශය

මූල්‍ය වාර්තා සැකසීමෙන් ව්‍යාපාරයකට ඇති ප්‍රතිලාභ.

- ව්‍යාපාරය තත්ත්වය පිළිබඳ අවබෝධයක් ලබා ගැනීම.
- ව්‍යාපාරයට ප්‍රාග්ධනය සැප යා ගැනීමේදී ගැනීමේදී අදාළ පුද්ගලයන්ට හා ආයතන වලට ඉදිරිපත් කිරීම .
- ආදායම් බදු කාර්යය සඳහා බදු වාර්තා සැකසීමට .
- ආයතනය තුළ හෝ සමාන ව්‍යාපාර තොරතුරු සමග සැසඳීමට .
- නීතිමය තත්ත්වයන්ට අනුකූල වීම .
- විගණන කටයුතු කිරීමට

**මූල්‍ය අනුපාත** .

විචල්‍යයන් දෙකක් අතර පවත්නා සම්බන්ධතාවය නිරූපණය කරන පිළිගත් ක්‍රමයක් වශයෙන් මූල්‍ය අනුපාත පෙන්වා දිය හැක .

මූල්‍ය අනුපාත ගණනය කිරීමේ වාසි

- ව්‍යාපාරය ද්‍රවශීලතාවය හා ලාභදායීත්වය පිළිබඳ ඉක්මන් අවබෝධයක් ලබාගත හැකිවීම
- වෙනස් සමාන ව්‍යාපාරයන් සමග සැසඳීම පහසු වීම
- ව්‍යාපාර අනාගත කටයුතු සැලසුම් කිරීම
- ව්‍යාපාරයේ වර්තමාන හා අතීත තත්ත්වයන් සැසඳීම
- ව්‍යාපාරය අවාසිදායක වෙනස්වීම් හදුනා ගත හැකි වීම

## මූල්‍ය අනුපාත වර්ග

මූල්‍ය කළමනාකරණයේ දී අනුපාත වර්ග රැසක් යොදා ගන්නා අතර ඒවා ප්‍රධාන වශයෙන් පදනම් හතරක් යටතේ බෙදා වෙන් කළ හැක.

1. ද්‍රවශීලතා අනුපාත
2. ලාභදායිත්ව අනුපාත
3. ක්‍රියාකාරී අනුපාත
4. තෝලන අනුපාත
5. ද්‍රවශීලතා අනුපාත

ව්‍යාපාරයක කෙටි කෙටි කාලීන මූල්‍ය බැඳීම් නොහොත් වගකීමට මුහුණදීමට ව්‍යාපාර වලට ඇති හැකියාව මෙමගින් පෙන්නුම් කෙරේ.

මේ අනුව පිළියෙළ කරනු ලබන ද්‍රවශීල අනුපාත වර්ග වන්නේ ,

- ජංගම අනුපාත
- ක්ෂණික අනුපාත

### ජංගම අනුපාතය

ජංගම වත්කම් හා ජංගම වගකීම් අතර සම්බන්ධතාවය පෙන්නුම් කරන අනුපාතය වේ.

එනම් ජංගම වගකීම් වලට මුහුණදීම සඳහා ජංගම වත්කම් වලට ඇති හැකියාව වේ.මෙය ගණනය කරනුයේ

ජංගම අනුපාතය = ජංගම වත්කම් /ජංගම වගකීම්

සාමාන්‍යයෙන් මෙම සමීකරණය ලද පිළිතුර අවම වශයෙන් දෙකක් වත් තිබිය යුතු යැයි පොදු පිළිගැනීමයි .

### ක්ෂණික අනුපාතය

ජංගම වත්කම් හා ද්‍රවශීල වත්කම් අතර ඇති සම්බන්ධය පෙන්නුම් කරන අනුපාතය වේ .

ජංගම වත්කම් තුළ වැඩි ප්‍රතිශතයක් ද්‍රවශීලතාවය අනුව බඩු තොගය අන්තර්ගත වන නිසා එය ඉවත් කොට ද්‍රවශීල වත්කම් තුලින් ජංගම බැරකම් වලට මුහුණ දීමට ඇති ශක්තිය මෙමගින් බලනු ඇත .මෙය ගණනය කරනුයේ ,

ක්ෂණික අනුපාතය ද්‍රවශීල අනුපාතය /ජංගම වගකීම්

ද්‍රවශීල වත්කම් = ජංගම වත්කම් * ( බඩු තොගය ඉදිරියට කළ වියදම් )

ඉහත සමීකරණය තුලින් ලද පිළිතුර අවම වශයෙන් එකක් වත් පැවතිය යුතු යැයි පොදු පිළිගැනීම වේ

## ලාභදායිත්ව අනුපාත

වත්කම් කොටස් ආයෝජනය හා විකුණුම් මත ව්‍යාපාරය උපයන ලාභය කොපමණද යන්න පිළිබිඹු කිරීම සඳහා ලාභදායිතා අනුපාත භාවිතා කෙරේ .

මේ අනුව ගණනය කරනු ලබන ලාභදායිත්ව අනුපාත හතරක් දක්නට ලැබේ .

- දළ ලාභ අනුපාත
- ශුද්ධ ලාභ අනුපාත
- ආයෝජන මත ප්‍රතිලාභ අනුපාතය
- හිමිකම් ප්‍රාග්ධනය මත ප්‍රතිලාභ අනුපාතය

දළ ලාභ අනුපාතය

විකුණුම් වලට අනුව දළ ලාභයේ ප්‍රමාණය ප්‍රතිශතයක් ලෙස මෙම අනුපාතයෙන් පෙන්නුම් කිරීමයි .එනම් මෙය ගණනය කරනුයේ,

දළ ලාභ අනුපාතය=( දළ ලාභය / විකුණුම්)× 100

ශුද්ධ ලාභ අනුපාතය

ව්‍යාපාරයෙහි ශුද්ධ ලාභය විකුණුම් වල ප්‍රතිශතයක් ලෙස මෙම අනුපාතයෙන් පෙන්නුම් කෙරේ .මෙහි ශුද්ධ ලාභය ලෙස සැලකිල්ලට ගනුයේ බදු පෙර සුද්ද ලාභයයි.මෙය ගණනය කරනුයේ ,

ශුද්ධ ලාභ අනුපාතය = (බදු පෙර ශුද්ධ ලාභය/විකුණුම් )×100

සමහර ව්‍යාපාරයක දළ ලාභ අනුපාතය ඉහළ අගයක් පෙන්නුම් කරනු ලැබුවද ශුද්ධ ලාභ අනුපාතය ඉතා පහළ අගයක් පෙන්නුම් කරන අවස්ථා ඇත.

මෙයට හේතුව දළ ලාභ අනුපාතය ගණනය කිරීමේදී විකුණුම් පිරිවැය පමණක් සැලකිල්ලට ගත්තද ශුද්ධ ලාභ අනුපාතය ගණනය කිරීමේදී ආයතන හා පරිපාලන,මූල්‍ය හා වෙනත්,විකුණුම් හා බෙදාහැරීමේ යන වියදම් අන්තර්ගත නිසාය .ආයතනයේ කළමනාකාරිත්වය දුර්වල ව පවතින අවස්ථාවක ශුද්ධ ලාභ අනුපාතය ඉතා පහළ අගයක් පෙන්නුම් කළ හැක.

## ආයෝජන මත ප්‍රතිලාභ අනුපාතය

මුළු ආයෝජනයට අනුපාතිකව ව්‍යාපාරය ඉපයුම් වල සම්බන්ධතාවය ප්‍රතිශතයක් ලෙස මින් පෙන්නුම් කෙරේ .

මෙය ගණනය කරනුයේ.

ආයෝජන මත ප්‍රතිලාභ අනුපාතය = (( බදු පසු ශුද්ධ ලාභයූ පොලිය )/ මුළු වත්කම් )×100

## හිමිකම් ප්‍රාග්ධන මත ප්‍රතිලාභ අනුපාතය

සාමාන්‍ය කොටස් හිමියන් විසින් සපයන ලද ප්‍රාග්ධනය සඳහා උපයන ලද ප්‍රතිලාභ ප්‍රතිශතයක් ලෙස මෙම අනුපාතයෙන් පෙන්නුම් කිරීමයි.මෙය ගණනය කරනුයේ.

හිමිකම් ප්‍රාග්ධනය මත ප්‍රතිලාභ අනුපාතය = (බදු පසු ශුද්ධ ලාභය * වරණීය ලාභාංශ / හිමිකම් ප්‍රාග්ධනය )×100

හිමිකම් ප්‍රාග්ධනය සාමාන්‍ය කොටස් ප්‍රාග්ධනයූ සංචිත

## ක්‍රියාකාරී අනුපාතය

වත්කම්වල ආයෝජනය හා ඒවායින් ගණිත කරන ඉපයීම් අතර ඇති සම්බන්ධතාවය ක්‍රියාකාරී අනුපාතය මගින් පෙන්නුම් කෙරේ.

මෙහිදී ගණනය කරන ක්‍රියාකාරී අනුපාත වර්ග තුනක් ඇත.

1. තොග පිරිවැටුම් අනුපාතය
2. ණයගැති පිරිවැටුම් අනුපාතය
3. මුළු වත්කම් පිරිවැටුම් අනුපාතය

## 1. තොග පිරිවැටුම් අනුපාතය.

ව්‍යාපාරය බඩු තොගය විකුණුම් බවට පත් කිරීමේ සීඝ්‍රතාවය ප්‍රමාණාත්මකව දැක්වෙන අනුපාතය මෙය වේ .මෙය ගණනය කරනුයේ,

තොග පිරිවැටුම් අනුපාතය = ( විකුණුම් භාණ්ඩ වල පිරිවැය / සාමාන්‍ය බඩු තොගය )×100

සාමාන්‍ය බඩු තොගය =(ආරම්භක බඩු තොගය+ අවසාන බඩු තොගය) / 2

මෙමගින් ලැබෙන පිළිතුරෙන් අදහස් වන්නේ වර්ෂයක් තුළ බඩු තොගයක් කොපමණ වාර ගණනක් විකුණුම් බවට පත්වූයේ ද යන්නයි .එසේ ලැබෙන වාරගණන වර්ෂයට අදාළ මාස ගණන දොළහෙන් බෙදීමෙන් කාලය තීරණය කළ හැක.

විකුණු වාර ගණන වැඩි වෙන තරමට ගත වන කාල පරිච්ඡේදය අඩුවන බවත් ව්යාපාර කාර්යක්ෂමතාව ඉහළ ඉහළ මට්ටමක පවතින බවත් නිගමනය කළ හැක

## 2. ණයගැති පිරිවැටුම් අනුපාතය

ව්‍යාපාරය කොතරම් කාර්යක්ශම ලෙස ණයගැතියන් ගෙන් මුදල් එකතු කර ගන්නේ ද යන්න මෙම අනුපාතයෙන් පෙන්නුම් කෙරේ . මේ ගණනය කරනුයේ,

ණයගැති පිරිවැටුම් අනුපාතය =(ණයට විකුණුම් / සාමාන්‍ය ණයගැතියෝ)×100

සාමාන්‍ය ණයගැතියෝ= (ආරම්භක ණයගැතියෝ+ අවසාන ණයගැතියෝ)/2

## 3. මුළු වත්කම් පිරිවැටුම් අනුපාතය

ව්‍යාපාරයෙන් මුළු වත්කම් හා විකුණුම් අතර ඇති සම්බන්ධතාවය මින් පෙන්නුම් කෙරේ .එනම් ව්‍යාපාරය සතු මුළු වත්කම් කොතෙක් දුරට කාර්යක්ශම යොදාගෙන තිබේ ද යන්න පෙන්නුම් කිරීමයි. මෙය ගණනය කරනුයේ,

මුළු වත්කම් පිරිවැටුම් අනුපාතය = විකුණුම්/ මුළු වත්කම්×100

**තෝලන අනුපාතය**

ආයතනයේ අයිතිකරුවන්ගේ ප්‍රාග්ධනය හා ණය ප්‍රාග්ධනය අතර ඇති සම්බන්ධතාවය පෙන්නුම් කරන අනුපාතය මෙය වේ මෙයවේ මෙහිදී ගණනය කරන තෝලන අනුපාත තුනකි .

1. ණය අනුපාතය
2. ණය හිමිකාරිත්ව අනුපාතය
3. පොලි ආවරණ අනුපාතය

1. ණය අනුපාතය.

ආයතනය මුළු ප්‍රාග්ධනයෙන් කොපමණ ප්‍රමාණයක් ණය ප්‍රාග්ධනයෙන් සමන්විත ද යන්න ප්‍රතිශතයක් වශයෙන් මෙම අනුපාතය තුළින් පෙන්නුම් කෙරේ මෙය ගණනය කරනුයේ,

ණය අනුපාතය =( ස්ථිර පොලියක් ගෙවන ප්‍රාග්ධනය/ මුළු ප්‍රාග්ධනය )×100

ස්ථිර පොලියක් ගෙවන ප්‍රාග්ධනය, වරණීය කොටස් ප්‍රාග්ධනය, ණයකර, දිගු කාලීන ණය

2. ණය හිමිකාරීත්ව අනුපාතය

හිමිකරුවන්ගේ ප්‍රාග්ධනයෙන් ස්ථිර පොලී අනුපාතයක් ගෙවන ප්‍රාග්ධනයක් ඇත ඇත ඇති සම්බන්ධය පෙන්නුම් කරන අනුපාතය ණය හිමිකාරිත්ව අනුපාතය නම් වේ ,

මෙය ගණනය කරනුයේ,

ණය හිමිකාරීත්ව අනුපාතය = ස්ථිර පොලියක් ගෙවන ප්‍රාග්ධනය / හිමිකම් ප්‍රාග්ධනය ×100

හිමිකම් ප්‍රාග්ධනය, සාමාන්‍ය කොටස්, සංචිත

ඉහත සමීකරණය ලැබෙන පිළිතුරින් ප්‍රධාන තෝලන අවස්ථා දෙකක් නිරූපණය කරයි.

1. අධි තෝලනය

හිමිකරුවන්ගේ ප්‍රාග්ධනයට වඩා ණයකරුවන්ගේ ප්‍රාග්ධනයේ වඩා ඉහළ අගයක් ගන්නා අවස්ථාවන්ය . මෙවැනි තත්ත්වයක් ව්‍යාපාරයකට වාසි මෙන්ම අවාසි ද වේ . ලාභ ඉහළ මට්ටමක පවතින අවස්ථාවක ණය සඳහා පොලිය බේරුම් කිරීමෙන් පසු ඉතිරි වන ලාබය සිටින හිමිකරුවන් ප්‍රමාණයක් අතරේ වැඩි ප්‍රතිශතයකට බෙදාගත හැකිය .

එසේම ලාභ අඩුවෙන් පවතින අවස්ථාවක ලබන ලාභය ණය හා පොලිය බේරුම් කිරීමට අපහසු වීමෙන් අපහසු වීමෙන් ව්‍යාපාරය බුන්වත් වීමට වීමටද ඉඩ ඇත .

2. අව තෝලනය.

හිමිකරුවන්ගේ ප්‍රාග්ධනයට වඩා වැඩියෙන් පවතින අවස්ථාවක් අවතරණය ලෙස සැලකේ එවැනි අවස්ථාවක ලාභය වැඩි පිරිසක් අතර බෙදී යාම හා කළමනාකරණය සඳහා යම් යම් බලපෑම් එල්ල කිරීමට ද ඉඩ ඇත .

පොලි ආවරණ අනුපාතය.

ව්යාපාරයෙ ඉපයීම් වලින් පොලිය කී වාරයක් ගෙවිය යුතු ද යන්න මෙම අනුපාතයෙන් පෙන්නුම් කෙරේ කළේ මෙය ගණනය කරනුයේ ,

පොලි ආවරණ අනුපාතය =පොලිය හා බදු පෙර ලාභය/ පොලිය ×100

## අරමුදල් ආයෝජනය.

මුල කළමනාකරුවකුට අරමුදල් ආයෝජනය කිරීම සඳහා විකල්ප මාර්ග රාශියක් පවතී එම නිසා ආයෝජනය පිළිබඳ නිවැරැදි තීරණයකට එළැඹිය යුතුය .

ආයෝජන තීරණ යනු ජංගම වත්කම් හා ස්ථාවර වත්කම් වල පර මුදල් යෙදවීම සම්බන්ධ තීරණයන් වේ

## ආයෝජන තීරණ වර්ග

මූල්‍ය කලමනාකරුවෙකු ආයෝජනය පිළිබඳ තීරණ දෙකකට ප්‍රධාන වශයෙන් එළඹිය යුතුය

### 1. කෙටි කාලීන ආයෝජන තීරණ

කාරක ප්‍රාග්ධන තීරණ හෙවත් කෙටි කෙටි කාලීන ආයෝජන තීරණ මින් අදහස් කෙරේ

උදාහරණ :

- මුදල්
- ණයගැතියෝ
- වෙළඳ තොග
- වෙනත් කෙටි කාලීන ආයෝජන

### 2. දිගුකාලීන ආයෝජන තීරණ

ප්‍රාග්ධන ආයෝජන තීරණ හෙවත් දිගුකාලීන ආයෝජන මෙනමින් හඳුන්වයි.

උදාහරණ:

- ව්‍යාපාරය වැඩි දියුණු කිරීමේ තීරණ
- ව්‍යාපාරය නවීකරණය කිරීමේ තීරණ
- ව්‍යාපාර විවිධාංගීකරණය විවිධාංගීකරණය කිරීමේ තීරණ

ඉහත කුමන ආයෝජන වර්ගයක් තෝරා ගනු ලැබුවද නිවැරදි ආයෝජන තීරණ ව්‍යාපාර සාර්ථකත්වයට මග පාදයි එම නිසා එමනිසා යෝග්‍ය ආයෝජන මාර්ගයක් තෝරා ගැනීමේදී සලකා බැලිය යුතු කරුණු රාශියකි

## ආයතනයක අරමුදල් ආයෝජනය කිරීමේදී සලකා බැලිය යුතු කරුණු

ආයෝජනයේ ප්‍රතිලාභ.

- අවදානම
- ආයෝජනයේ පිරිවැය

- ආයතනයේ ආයෝජන ප්‍රතිවිපාක
- අවිනිශ්චිතතා
- පරිසර සාධක
- නීතිමය තත්වයන්
- ද්‍රවශීලතාවය
- මෙහෙයුම් ක්‍රියාකාරීත්වයට ඇති බලපෑම

## ශ්‍රී ලංකාවේ මූල්‍ය පද්ධතිය.

රටක ආර්ථිකයක මූල්‍ය තීරණ ක්‍රියාත්මක කරන මූල්‍ය වෙළඳපොළවල්, මූල්‍ය ආයතන, මූල්‍ය උපකරණ හා මූල්‍ය යටිතල පහසුකම් යනාදීයෙන් සමන්විත පද්ධතිය මූල්‍ය පද්ධතිය නම් වේ. මූල්‍ය පද්ධතිය තුළ සිදුවන වැදගත් කාර්යය වන්නේ මූල්‍ය අතරමැදිකරණයයි.

මූල්‍ය පද්ධතියක සංයුතිය.

- මූල්‍ය ආයතන
- මූල්‍ය උපකරණ
- මූල්‍ය යටිතල පහසුකම්
- මූල්‍ය වෙළඳපොළවල්
- ශ්‍රී ලංකා මහ බැංකුව

## 1. මූල්‍ය යටිතල පහසුකම්

මූල්‍ය ක්‍රමයේ මනා ක්‍රියාකාරීත්වය හා ස්ථායිතාවය තහවුරු කිරීම සඳහා ගෙවීම් හා පියවීම් පද්ධතිය මූල්‍ය යටිතල පහසුකම් වේ. උදාහරණ

1. තත්කාලීන දළ පියවීම් පද්ධතිය

2. නිර්ලේඛණ සුරැකුම්පත් පියවීමේ පද්ධතිය

3. ඡායාගත පිළිබිඹු චෙක්පත් නිශ්කාෂණ පද්ධතිය

(වාණිජ බැංකුවල චෙක්පත් වල වටිනාකම් තුලනය කිරීම සඳහා ලංකා ක්ලියර් පුද්ගලික සමාගම විසින් පවත්වාගෙන යනු ලබන පරිගණකගත සන්නිවේදන ජාලයවේ)

## 2. මූල්‍ය වෙලඳපොලවල්.

අරමුදල් සපයන්නන් හා අරමුදල් ඉල්ලුම් කරන්නන් සම්බන්ධ කිරීම සඳහා පවත්නා සංවිධාන ක්‍රමය මූල්‍ය වෙළඳපල නම් වේ. එනම් අරමුදල් අතිරික්තතා සහිත පාර්ශවයන් හා අරමුදල් ඌනතාවයක් සහිත පාර්ශවයන් එකිනෙකට සම්බන්ධ කිරීමයි. වෙළඳපල තුල සිදුවන ප්‍රධාන කාර්යභාරය වන්නේ මූල්‍ය වත්කම් මිලට ගැනීම හා විකිණීමයි.

### මූල්‍ය වෙළඳපලේ සංයුතිය.

ශ්‍රී ලංකාවේ මූල්‍ය වෙළෙඳපොළ පහත උප වෙළඳපල වලින් සමන්විත වේ.

1. අන්තර් බැංකු ඒක්ෂණ ණය වෙළඳපල
2. දේශීය විදේශීය විනිමය වෙළෙඳපොළ
3. රජයේ සුරකුම්පත් ණයකර වෙළෙඳපොළ
    - භාණ්ඩාගාර බිල්පත් වෙළෙඳපොළ
    - භාණ්ඩාගාර බැඳුම්කර
4. සාංගමික ණය සුරකුම්පත් වෙළඳපල
    - වාණිජ පත්‍රිකා වෙළඳපල
    - සාංගමික බැඳුම්කර වෙළඳපල
5. කොටස් වෙළඳපල

ඉහත සඳහන් මූල්‍ය වෙළඳපල එහි කටයුතු කරන කාල පරිච්ඡේදය සැලකිල්ලට ගෙන ප්‍රධාන වශයෙන් වර්ග දෙකකට බෙදේ

1. මුදල් වෙළඳපළ
2. ප්‍රාග්ධන වෙළඳපළ

### මුදල් වෙළෙඳපොළ

වසරකට අඩු කාල පරිච්ඡේදයක් ඳහා අරමුදල් අවශ්‍යතා සම්පාදනය කරන වෙළඳපල වේ. එනම් කෙටි කාලයේ අරමුදල් අතිරික්තතා සහිත පාර්ශවයන් හා අරමුදල් ඌනතාවක් පවතින පාර්ශවයන් එකිනෙකට සම්මුඛ කිරිමයි.

මුදල් වෙළෙඳපොළ තුළ ක්‍රියාත්මක වන උපකරණ

- ■ භාණ්ඩාගාර බිල්පත්
- ■ වාණිජ පත්‍රිකා
- ■ තැන්පතු සහතික

මුදල් වෙළෙඳපොළ තුළ ක්‍රියාත්මක වන ආයතන

- ශ්‍රී ලංකා මහ බැංකුව
- බලපත්‍ර ලාභී වාණිජ බැංකු
- බලපත්‍රලාභී විශේෂිත බැංකු
- ලියාපදිංචි මූල්‍ය සමාගම්
- මුදල් තැරැව්කාර සමාගම්
- මුදල් වෙළෙඳපොළ තුළ ක්‍රියාත්මක වන උප වෙළඳපළවල්
- අන්තර් බැංකු ඒක්ෂණ ණය වෙළඳපල
- දේශීය විදේශීය විනිමය වෙළෙඳපොළ
- භාණ්ඩාගාර බිල්පත් වෙළඳපල
- වාණිජ පත්‍රිකා වෙළඳපල

### අන්තර් බැංකු ඒක්ෂණ ණය වෙළෙඳපොළ

ද්‍රවශීලතා හිඟයෙන් පෙළෙන බැංකු සිය ද්‍රවශීලතා අවශ්‍යතා සපුරා ගැනීමට අතිරික්ත ද්‍රවශීලතාවය සහිත වාණිජ බැංකු තුළිනි. කෙටිකාලීනව මුදල් ණයට ගැනීම ඒක්ෂණ ණය ගනුදෙනු නම් වේ. එම ගනුදෙනු සිදුවන වෙළඳපල අන්තර් බැංකු ඒක්ෂණ ණය වෙළඳපලසේ හඳුන්වයි. එම ගනුදෙනු සිදු වන්නේ ශ්‍රී ලංකා මහ බැංකුවේ ඇති එම බැංකු සතු සංචිත ගිණුම් හරහා ය.

### දේශීය විදේශීය විනිමය වෙළෙඳපොළ

වාණිජ බැංකුවල විදේශ ව්‍යවහාර මුදල් ගණුදෙනු වලට අදාලව සිදුවන කටයුතු දේශීය විදේශීය විනිමය වෙළෙඳපොළ නම් වේ. මෙහි කටයුතු වශයෙන් විදේශ විනිමය මිලට ගැනීම හා විකිණීම, ණයට ගැනීම හා විකිණීම, තැන්පතු ගිණුම් පවත්වාගෙන යාම ආදිය සිදුවේ.

### භාණ්ඩාගාර බිල්පත් වෙළෙඳපොළ

රජයට අවශ්‍ය කෙටිකාලීන ණය සපයා ගැනීම සඳහා රජය වෙනුවෙන් ශ්‍රී ලංකා මහ බැංකුව නිකුත් කරන නිර්ලේඛන සුරැකුම්පත් වේ. මේවා දින 91 දින 182 හා දින 364 යන කාල සීමා සඳහා නිකුත් කරනු ලැබේ. වට්ටම් අඩු කළ ක්‍රමය යටතේ වෙන්දේසි ක්‍රමයට සුරැකුම්පත් අලෙවි කරනු ලබයි.

### භාණ්ඩාගාර බිල්පත් වෙළෙඳපොළ

රජයට අවශ්‍ය කෙටිකාලීන ණය ලබාගැනීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරනු ලබන මූල්‍ය උපකරණ භාණ්ඩාගාර බිල්පත් බවත් එම බිල්පත් හුවමාරු වන වෙළෙඳපොළ භාණ්ඩාගාර බිල්පත් වෙළෙඳපොළ ලෙසත් හඳුන්වයි. මෙම වෙළඳපල ස්වරූප දෙකකින් යුක්තය.

1. ප්‍රාථමික වෙළඳපල

ශ්‍රී ලංකා මහ බැංකුවේ අවසරලත් නියෝජිතයන් මාර්ගයෙන් සාමාන්‍ය ආයෝජකයන්ට බිල්පත් අලෙවි කිරීම භාණ්ඩාගාර බිල්පත් ප්‍රාථමික වෙළඳපල නම් වේ.

2. ද්විතියික වෙළඳපල

වෙළෙඳපොළ ප්‍රාථමික වෙළෙඳ පොළෙන් මිලට ගත් භාණ්ඩාගාර බිල්පත් කල් පිරෙන තෙක් තබා නො ගෙන ආයෝජකයන් අතර ගනුදෙනු කිරීම භාණ්ඩාගාර බිල්පත් ද්විතියික වෙළඳපල වේ

භාණ්ඩාගාර බිල්පත් ආයෝජනය වාසි

1. ඉහළ ප්‍රතිලාභ

2. ඉහළ ද්‍රවශීලතාව

3. ඉහළ ආරක්ෂාව

4. බදු සහන ලැබීම

5. කල් පිරීමට පෙර වට්ටම් කරවා ගත හැකි වීම

6. ඇප සඳහා භාවිත කළ හැකිවීම

## වාණිජ පත්‍රිකා වෙළඳපල

වාණිජ පත්‍රිකා

සීමාසහිත පොදු සමාගම් විසින් කෙටිකාලීන අරමුදල් අවශ්‍යතා සඳහා භාවිතා කරන මූල්‍ය උපකරණයකි. මේවා සාපේක්ෂ ඉහළ වටිනාකම් වලින් නිකුත් කෙරෙන අතර ඒවායේ ආපසු ගෙවීමේ හැකියාව නිකුත් කරනු ලබන මූල්‍ය ආයතන විසින් සහතික කර ඇත.

වාණිජ පත්‍රිකා වෙළඳපල

ව්‍යාපාර ආයතන සිය කෙටිකාලීන අරමුදල් සම්පාදනය කර ගැනීම සඳහා නිකුත් කරන වාණිජ පත්‍රිකා හුවමාරුවන වෙළඳපල වාණිජ පත්‍රිකා වෙළෙඳපොළ නම් වේ.

## ප්‍රාග්ධන වෙළඳපල

දිගු කාලීන මූල්‍ය අවශ්‍යතා සම්පාදනය කර ගැනීම සඳහා ක්‍රියාකරන වෙළඳපල ප්‍රාග්ධන වෙළෙඳපොළ නම් වේ. එනම් දිගුකාලීනව අරමුදල් අතිරික්තතා සහිත පාර්ශවයන් හා ඌනතාවයන් සහිත පාර්ශවයන් එකිනෙකට සම්මුඛ කිරීමයි.

වෙළඳපල තුළ ක්‍රියාත්මක වන උපකරණ

- කොටස්
- කොටස් බලපත්‍ර

- ණයකර
- භාණ්ඩාගාර බැඳුම්කර
- රුපියල් ණය සුරකුම්පත්
- ඒකකභාර
- තැන්පතු සහතික

ප්‍රාග්ධන වෙළඳපළ තුළ ක්‍රියාත්මක වන ආයතන

- ශ්‍රී ලංකා මහ බැංකුව
- බලපත්‍රලාභී වාණිජ බැංකු
- බලපත්‍රලාභී විශේෂිත බැංකු
- රක්ෂණ ආයතන
- කල්බදු සමාගම්
- සේවක අර්ථසාධක අරමුදල
- සේවක භාරකාර අරමුදල
- ඒකකභාර
- කළමනාකරණ සමාගම්

ග්ධන වෙළඳපළ තුළ ක්‍රියාත්මක වන උප වෙළඳපොළවල්

- භාණ්ඩාගාර බැඳුම්කර වෙළඳපල
- සාංගමික බැඳුම්කර වෙළඳපල
- කොටස් වෙළඳපල

**රුපියල් ණය සුරකුම්පත්**

රජයට අවශ්‍ය මධ්‍ය හා දිගුකාලීන ණය ලබා ගැනීම සඳහා යොදා ගන්නා මූල්‍ය උපකරණ වේ. ණය මුදලේ ප්‍රමාණය මුහුණත වටිනාකමට සමාන වන අතර ණය මුදල ආපසු ගෙවන දිනයත් ඊට අදාළ පොලී අනුපාතිකයක් සහතික පත්‍රය සඳහන් වේ. මේවා නිකුත් කරන්නේ ලේඛන සහතික පත්‍රයක් ලෙසය.

තැන්පතු සහතික

මධ්‍යකාලීන අරමුදල් ලබාගැනීමට වාණිජ බැංකු විසින් තැන්පතු සහතික නිකුත් කෙරේ. තැන්පතු කරුගේ නම විස්තර මෙහි සඳහන් නොකරන අතර නියමිත කාලය අවසානයේ සහතිකය බැංකුව වෙත ඉදිරිපත් කරන්නා ට මුදල් ගෙවනු ලැබේ.

භාණ්ඩාගාර බැඳුම්කර

රජයට අවශ්‍ය මධ්‍ය කාලීන හා දිගු කාලීන ණය සපයා ගැනීමට රජය වෙනුවෙන් ශ්‍රී ලංකා මහ බැංකුව නිකුත් කරන නිර්ලේඛන සුරැකුම්පත් විශේෂයකි. මේවායේ ගණනය කිරීම වර්ෂ 2 සිට 20 දක්වා වූ විවිධ කාල සීමා යටතේ නිකුත් කෙරේ. මෙහි විශේෂත්වය නම් මේ සඳහා වන පොලිය අර්ධ වාර්ෂික කාර්තුවක් යටතේ බෙදා හැරීමයි.

භාණ්ඩාගාර බැඳුම්කර වෙළඳපල

රජයට අවශ්‍ය මධ්‍ය කාලීන හා දිගු කාලීන ණය ලබා ගැනීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරනු ලබන ණය උපකරණයක් ලෙස භාණ්ඩාගාර බැඳුම්කර හැඳින්විය හැක. මෙහි වෙළෙඳපොළ ස්වරූපයන් දෙකක් දැක ගත හැක.

1. ප්‍රාථමික වෙළඳපල

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ප්‍රාථමික අලෙවිකරුවන් හරහා ආයෝජකයන් වෙත බැඳුම්කර අලෙවිකරණ වෙළඳපොලයි.

2. ද්විතියික වෙ/පල

ප්‍රාථමික වෙළෙඳ පොළෙන් මිලට ගත් බැඳුම්කර කල් පිරෙන තෙක් ළඟ තබා නොගෙන ආයෝජකයන් අතර හුවමාරුවන වෙළඳපළ යි.

බැඳුම්කර ආයෝජනය වාසි

1. උපරිම ද්‍රවශීලතාවය

2. ඉහළ ප්‍රතිලාභ

3. රජය සුරකුම් පතක් බැවින් අවදානම අඩු වීම

4. බදු වලින් නිදහස් වීම

5. ඇපයක් වශයෙන් තබා ණය නිදහස් කළ හැකි වීම

**සාංගමික බැඳුම්කර**

රාජ්‍ය සංස්ථා හා සමාගම් විසින් මධ්‍ය කාලීන හා දිගුකාලීන අරමුදල් සපයා ගැනීම සඳහා නිකුත් කරනු ලබන ණය උපකරණය වේ. මෙම ණයකර නිකුත් කරන අවස්ථාවේදීම ඊට අදාළ කොන්දේසි හා ලැබෙන පොලිය සටහන් කරයි. අදාල පොලිය ද බදු වලින් නිදහස් වීම විශේෂත්වය වේ.

## සාංගමික බැඳුම්කර වෙළඳපල

සමාගම් විසින් මධ්‍ය හා දිගුකාලීන අරමුදල් අවශ්‍යතා සඳහා නිකුත් කරනු ලබන මෙම ණය උපකරණය මිලදී ගැනීම හා විකිණීම සිදු කරනු ලබන වෙළඳපල සාංගමික බැඳුම්කර වෙළඳපල නම් වේ.

ණයකර වර්ග

විවිධ ලක්ෂණ සහිත ණයකර නිකුත් කරන අතර එම ණයකර අදාළ ලක්ෂණය නමින් හඳුන්වනු ලබයි.

1. රක්ෂිත ණයකර

නිකුත් කරනු ලබන ආයතනයේ භෞතික සම්පත් සැපයක් ලෙස තබා නිකුත්කරන ණයකර වේ. සමාගම විසින් ගෙවීමට පොරොන්දු වූ පොලිය හා මුහුණත අගය ගෙවීමට අපොහොසත් වුවහොත් ඇපයට තබා ඇති වත්කම් විකුණා මුදල් ලබා ගැනීමට ණයකර හිමියන්ට අයිතිය ලබා දෙන ණයකර විශේෂයකි.

2. සහතික ණයකර

ණයකර නිකුත් කරන ආයතනයක් ගිවිසගත් ණයකර පොලී හා එහි මුහුණත අගය ගෙවීමට අපොහොසත් වූ විටදී එම වගකීම ඉටු කරන බවට පිළිගත් මූල්‍ය ආයතනයක් සහතික වන ණයකර විශේෂයකි.

3. කැඳවිය හැකි ණයකර

සමාගමක් විසින් නිකුත් කරන ණයකර වල පරිණත කාලය ඉකුත් වීමට පෙර නිශ්චිත මිලකට ණයකර හිමියන් ගෙන් ඒවා ආපසු මිලට ගැනීමේ අයිතියක් ඇතිව නිකුත් කරනු ලබන ණයකර වේ.

4. පරිවත්‍ය ණයකර

අදාල ණයකර පරිණත වීමට පෙර නිශ්චිත ආයතනයේ අනාගත කාල පරිච්ඡේදයක දී සමාගමේ නිශ්චිත සාමාන්‍ය කොටස් සංඛ්‍යාවකට පරිවර්තනය කිරීමේ අයිතිය ණයකර හිමියන්ට ලබාදෙන ණයකර විශේෂයකි.

5. යටත් ණයකර

සමාගමක් ඈවර කිරීමේදී රක්ෂිත ණයකර අනාරක්ෂිත ණයකර හා සමහර පොදු ණයහිමියන්ට ගෙවීම් කිරීමෙන් පසුව සමාගමේ ඉතිරිවන වත්කම් හා ආදායම් වලට අයිතියක් ලැබෙන ණය කර යටත් ණයකර වේ.

## කොටස් වෙළෙඳපොළ (කොළඹ කොටස් හුවමාරුව )

ලැයිස්තුගත සමාගම් වල කොටස් මිලට ගැනීම හා විකිණීම පරිපාලනය කරනු ලබන ආයතනය කොළඹ කොටස් හුවමාරුවයි. කොටස් හුවමාරුව ඇපයෙන් සීමිත සමාගමකි. ශ්‍රී ලංකාවේ කොටස් වෙළඳපළ ලෙස කටයුතු කිරීමේ බලය ශ්‍රී ලංකා සුරකුම්පත් හා විනිමය කොමිෂන් සභාව විසින් කොළඹ කොටස් හුවමාරුවට ලබා දී ඇත.

කොළඹ කොටස් වෙළඳපළ වැදගත් වීමට හේතු

1. පුද්ගලයන් හා ආයතන ආයෝජනය සඳහා දිරිගැන්වීම

2. ආයෝජකයන්ට කොටස් වෙළඳපළ හරහා ආයෝජනයේ විවිධ ප්‍රතිලාභ ලබා ගත හැකි වීම

3. සමාගම්වලට විශාල ප්‍රාග්ධනයක් රැස් කරගත හැකිවීම

4. රජය සුරැකුම්පත් අලෙවි කිරීම තුළින් රජයට අවශ්‍ය අරමුදල් ලබා ගත හැකි වීම

5. විදේශ ආයෝජකයන් රටට අද්දවා ගත හැකි වීම

6. සමාගම් වල කොටස් වලට වටිනාකමක් නිර්මාණය වීම

7. සමාගම්වල කීර්ති නාමය හා ප්‍රතිරූපය ඉහළ යාම

8. සමාගම් වල කොටස් සඳහා ද්විතීක වෙළඳ පළක් ඇති වීම

## කොටස් වෙළඳපොලේ විවිධ ස්වරූප

සමාගමක කොටස් අලෙවි වන ආකාරය සැළකිල්ලට ගෙන වෙළඳපල අවස්ථා දෙකක් හඳුනා ගත හැක.

1. ප්‍රාථමික වෙළඳපල

ආයෝජකයන් විසින් කොටස් නිකුත් කරන සමාගමකින් සෘජුවම කොටස් මිලදී ගැනීම මෙහිදී සිදු වේ. මෙම වෙළඳපළ ගනුදෙනු තුළින් සමාගමට අවශ්‍ය අරමුදල් සම්පාදනය කරනු ලබයි.

2. ද්විතීයික වෙළෙඳපොළ

ආයෝජකයන් විසින් කොළඹ කොටස් වෙළඳපළ තුළින් කොටස් මිලදී ගැනීම ද්විතියික වෙළෙඳපළකි.

නැතහොත් ප්‍රාථමික වෙළඳපල තුළින් මිලදි ගත් කොටස් නැවත ආයෝජකයන් අතර හුවමාරු කරන වෙළඳපලකි. මෙම වෙළඳපල තුලින් සමාගමකට අවශ්‍ය අරමුදල් සම්පාදනය නොකරයි. අරමුදල් සම්පාදනය කරනුයේ ආයෝජකයන්ට පමණි.

සමාගමක් මිල කළ සමාගමක් බවට ලියාපදිංචි විය හැකි ආකාර

1. මූලික ප්‍රසිද්ධ නිකුතුව මගින්

සමාගමක් පළමුවරට කොටස් නිකුත් කිරීමක් මගින් මහජනයාට දායක වීමට ඇරයුම් කර සමාගම කොටස් වෙළඳපළේ ලැයිස්තුගත කිරීම මූලික ප්‍රසිද්ධ නිකුතුව මගින් ලියාපදිංචිකිරීම නම් වේ.

2. විකුණුම් අර්පනයක් මගින්

දැනටමත් කොටස් නිකුත් කර ඇති සමාගමක් මහජනයා වෙත ඇති කොටස් වෙළඳපල විකිණීම තුළින් ලයිස්තුගත කිරීම විකුණුම් අර්පනයක් මගින් ලියාපදිංචිකිරීම වේ.

**සමාගමක් මිල සමාගමක් බවට පත්වීමෙන් අත්කරගත හැකි ප්‍රතිලාභ**

1. විශාල ප්‍රාග්ධනයක් රැස් කරගත හැකිවීම

2. අරමුදල් රැස් කිරීමට යන පිරිවැය අඩුය

3. වටිනාකමක් නිර්මාණය වීම

4. සමාගමේ කීර්ති නාමය හා ප්‍රතිරූපය ඉහළ යාම

සාමාන්‍ය කොටස් තුළ ලියාපදිංචි වීමට පවතින පුවරු

සාමාන්‍ය කොටස් මිළ කළ සමාගම් වලට ලියාපදිංචි වීම සඳහා පවත්වාගෙන යන පුවරු දෙකකි.

1. ප්‍රධාන පුවරුව

2. දිරි සවි පුවරුව

ප්‍රධාන පුවරුවේ සාමාන්‍ය කොටස් ලැයිස්තු ගත වීමට සපුරාලිය යුතු සුදුසුකම්

1. සමාගමේ ප්‍රකාශිත ප්‍රාග්ධනය අවම වශයෙන් රුපියල් මිලියන 500 ක් විය යුතු වීම

2. අවම වශයෙන් පූර්ව වසර තුනක් අඛණ්ඩව බදු වලට පෙර ලාභ උපයා තිබිය යුතු වීම

3. ලේඛනගත කරන කොටස් ප්‍රමාණය අවම වශයෙන් 25 ක් මහජනතාවට නිකුත් කොට තිබීම

4. ලැයිස්තුගත වීමට ඉල්ලුම් කළ දින සිට වසර දෙකක විගණනය කරනු ලබන මූල්‍ය වාර්තා නිකුත් කොට තිබීම

දිරිසවි පුවරුවේ ලැයිස්තුගත වීමට සමාගමක් විසින් සපුරාලිය යුතු සුදුසුකම්

1. සමාගමේ ප්‍රකාශිත ප්‍රාග්ධනය රුපියල් මිලියන 100 ක ට නොඅඩු විය යුතුය

2. ලේඛනගත කරන කොටස් ගම්මානයෙන් අවම වශයෙන් සියයට දහයක් මහජනතාවට නිකුත් කොට තිබීම

3. අවම වශයෙන් වසර 01ක ව්‍යාපාර ක්‍රියාකාරීත්වයක් පෙන්නුම් කිරීම

4. වසරක විගණන කරන ලද මූල්‍ය වාර්තා නිකුත් කොට තිබීම

කඩකළ පුවරුව

කොටස් වෙළඳපලෙහි ලයිස්තු ගත කිරීමේදී නියම කරන ලද කොන්දේසි කඩ කරන හා නොපිළිපදින සමාගම් ඇතුළත් කරනු ලබන පුවරුව කඩකළ පුවරුව නම් වේ. උදාහරණ

* ණයකර වලට පොලිය හා ප්‍රාග්ධනය නියමිත දින බේරුම් කිරීමට අපොහොසත්වීම

* මූල්‍ය වාර්තා නිසි පරිදි ඉදිරිපත් නොවීම

OTC පුවරුව

නිල නොවන සමාගමේ කොටස් වල මිල කරවා ගැනීම සඳහා කොටස් වෙළඳපළ තුළ පවත්වාගෙන යන පුවරුවකි. බොහෝ දුරට අනාගතයේ දී මිළ කළ සමාගමක් බවට පත් වීමට අපේක්ෂාවෙන් සිටින සමාගම් මෙම පුවරුවෙ හි ලියාපදිංචි වනු ඇත.

**කොළඹ කොටස් හුවමාරුවේ ගනුදෙනු වන සුරැකුම්පත් වර්ග**

1. සා/කො

මෙම කොටස් මිලදී ගැනීමෙන් ආයෝජකයා සමාගමේ අයිතිකරුවකු වන අතර වාර්ෂික මහා සභා රැස්වීමට සහභාගිවීමට අවස්ථාව ලැබේ. මෙම කොටස් හිමියන්ට නිශ්චිත ලාභාංශ ප්‍රතිශතයක් හිමි නො වේ. විශේෂයෙන් අවදානම් දැරීමට හැකියාවක් තිබීම මඟින් ආයෝජකයන්ට මෙම කොටස් ලබා ගත හැකිවේ.

සාමාන්‍ය කොටස් ප්‍රභේද දෙකකි

1. ඡන්ද බලය සහිත කොටස්

මහා සභා රැස්වීම් වලට සහභාගි වී තීරණ වලට එළඹීමේ යෝජනාව අනුමත කර ගැනීම සඳහා ඡන්දය භාවිතා කිරීම සඳහා හැකියාවක් තිබෙන කොටස් වේ.

2. ඡන්ද බල රහිත කොටස්

සාමාන්‍ය කොටස් වලට හිමි අනෙකුත් සියලුම වරප්‍රසාද හිමිවන එහෙත් මහා සභා රැස්වීම් වලදී ඡන්ද බලය හිමි නොවන කොටස් වේ.

2. වරණීය කොටස්

මිශ්‍ර ලාභාංශ ප්‍රතිශතයක් හිමි සමාගම විසින් අවස්ථාවකදී ප්‍රාග්ධනය ආපසු ගෙවන විට ප්‍රමුඛත්වය හිමි වන කොටස් වරණීය කොටස් වේ. මෙම කොටස් කොටස් හිමියන්ට සමාගම අයිති හිමි නොවේ.

3. කොටස් බලපත්‍ර

අනාගතයේ දී නිශ්චිත මිලකට කොටස් මිලදී ගැනීමට අයිතිය ලබා දෙමින් වර්තමානයේදී සමාගමක් විසින් නිකුත් කරන ලද ලියවිල්ලක් වේ. බලපත්‍රය කොටස් බවට පත්වන තෙක් වෙනත් ප්‍රතිලාභ ලැබිය නොහැක.

4. සාංගමික බැඳුම්කර

සමාගමකට ණය ප්‍රාග්ධනය ලබා ගැනීම සඳහා සමාගමක් විසින් නිකුත් කරනු ලබන සුරකුම්පත් විශේෂයෙකි. ලයිස්තුගත සමාගම් විසින් නිකුත් කරනු ලබන ලැයිස්තුගත ණයකර කොටස් වෙළඳපළේ හුවමාරු කළ හැක. ණයකර වල ආයෝජකයන්ට නිශ්චිත පොලී ප්‍රතිශතයක් හිමිවේ.

5. රාජ්‍ය ණය සුරකුම්පත්

6. අව්‍යාන්තාන්ත අරමුදල්

පරිණත කාලයක් නොමැති වන්නාවූ ඒකක භාරයක් වේ.

## කොටස් වෙළඳපලේ හුවමාරුවන සුරැකුම්පත්වල ආයෝජනය කිරීමේ ප්‍රතිලාභ

* ලාභාංශ ආදායම්
* ප්‍රාග්ධන ලාභ
* හිමිකම් නිකුතුව
* ප්‍රසාද කොටස් නිකුතුව
* විභජනය
* පොලි ආදායම්

1. ලාභාංශ ආදායම්

සමාගමක් එහි ව්‍යාපාර කටයුතු පවත්වාගෙන යාම තුළින් උපයන ශුද්ධ ලාභයෙන් සමාගමේ කොටස් හිමියන්ට බෙදාහරින ප්‍රමාණය ලාභාංශ ආදායම වේ. ලාභාංශ මුල්‍යමය ලෙස හෝ කොටස් ලෙස ප්‍රකාශයට පත්කෙරේ. සාමාන්‍ය හා වරණීය කොටස් වෙනුවෙන් මෙසේ ලැබෙන ලාභාංශ සමාගමට කොටස් සඳහා ගෙවා හිමි ප්‍රාග්ධනය මත හිමිවේ.

2. සංචිත ප්‍රාග්ධනී කරණය

මෙහිදී සමාගම සතුව පවතින සංචිත කොටස් බවට පත් කිරීමක් සිදුවේ. මෙහිදී දැනට සිටින සාමාන්‍ය කොටස් හිමියන්ට යම් අනුපාතයකට අනුව නව කොටස් ලැබීමක් සිදු වේ. සංචිත ප්‍රාග්ධනී කරණයේදී සමාගම සමාගමේ ප්‍රකාශිත ප්‍රාග්ධනය වැඩිවීමක් සිදුවේ.

3. හිමිකම් නිකුතුව

සමාගමේ දැනට සිටින සාමාන්‍ය කොටස් හිමියන්ට කිසියම් අනුපාතයකට අනුව කොටස් ලබා දීමක් මෙහිදී සිදුවේ. හිමිකම් නිකුතුව මගින් ලැබෙන කොටස් සඳහා කොටස් හිමියා විසින් සමාගමට මුදල් ගෙවිය යුතුය.

4. ප්‍රාග්ධන ලාභ

කොටසක විකුණුම් මිල එහි ගැනුම් මිල ඉක්මවයි නම් කොටස්වල ආයෝජකයන්ගෙන් අත් කරගන්නේ ප්‍රාග්ධන ලාබයි.

5. විභජනය

සමාගමක් නිකුත් කර ඇති කොටස් ප්‍රමාණය තීරණය කළ අනුපාතයට නැවතත් බෙදාහැරීම මගින් ආයෝජකයාට ප්‍රතිලාභ ලබා දීම මෙහිදී සිදු වේ. විශේෂත්වයනම් ප්‍රකාශිත ප්‍රාග්ධනය වැඩි නොවන අතර නිකුත් කරන කොටස් සංඛ්‍යාව පමණක් ඉහල යාමයි.

6. පොලී ආදායම්

සාංගමික ණයකර හා රජයේ සුරැකුම්පත් සඳහා පොලී ආදායම් හිමිවේ.

ඉහත සඳහන් ප්‍රධාන ප්‍රතිලාභවලට අමතරව සුරැකුම්පත්වල ආයෝජනය ආයෝජකයන්ට වන වෙනත් ප්‍රතිලාභ ද ඇත. එනම්,

* සාමාන්‍ය කොටස් හිමියන්ට සමාගමේ අධ්‍යක්ෂවරයකු බවට පත් විය හැක

* ප්‍රාග්ධන ලාභ බදු වලින් නිදහස් වේ

* රජයේ සුරැකුම්පත්වල ආයෝජනය අවදානම ඉතා අඩු මට්ටමක පවතියි

* සුරැකුම්පත් ණය ලබා ගැනීමේදී ඇප සුරැකුමක් ලෙස භාවිතා කළ හැක

**කොළඹ කොටස් හුවමාරුවේ සංයුතිය**

- ශ්‍රී ලංකා සුරකුම්පත් හා විනිමය කොමිසම ආයෝජකයින්
- භාරකාර බැංකු

- සීමාසහිත මධ්‍යම තැන්පතු ක්‍රමය
- මුදල් අමාත්‍යංශය
- ලයිස්තුගත සමාගම්
- කොටස් තැරැව්කාර සමාගම්
- සීමාසහිත කොළඹ කොටස් හුවමාරු (ඇපකාර) සමාගම

සීමාසහිත කොළඹ කොටස් හුවමාරු (ඇපකාර) සමාගම

මිල කළ සමාගම් වල සුරකුම්පත් විවෘතව ගනුදෙනු කිරීම සඳහා ශ්‍රී ලංකාව තුළ පිහිටුවා ඇති ආයතනයයි.

හිමිකාරීත්වය: තැරැව්කාර සමාගම් සතු ය

පාලනය: කොළඹ කොටස් හුවමාරුව මගිනි

කළමනාකරණය: 09 දෙනකුගෙන් යුත් අධ්‍යක්ෂ මණ්ඩලයක් මගිනි

* අධ්‍යක්ෂ මණ්ඩලයෙන් පස්දෙනකු තැරැව්කාර සමාගම් වල නියෝජිතයකුගෙන් ද

* හතර දෙනෙකු ශ්‍රී ලංකා රජයේ මුදල් අමාත්‍යවරයා පත් කරයි

අධීක්ෂණය හා සුපරීක්ෂණය: ශ්‍රී ලංකා සුරකුම්පත් හා විනිමය කොමිසම මගින්

නිෂ්කාශනය: සීමාසහිත මධ්‍යම තැන්පතු ක්‍රමය මගින්

භාරකාර බැංකු

විදේශකයන් කොළඹකොටස් වෙළඳපළ ගනුදෙනු වලට සම්බන්ධ වන්නේ දේශීය බැංකු තුළ විදේශ විනිමය තැන්පතු පවත්වාගෙන යන සියාරා ගිණුම් මගින්ය. මෙම සියාරා ගිණුම් පවත්වාගෙන යන බැංකු භාරකාර බැංකු නම් වේ.

## සීමිත මධ්‍යම තැන්පතු ක්‍රමය

කොළඹ කොටස් හුවමාරුවේ පූර්ණ අනුබද්ධ ආයතනයක් ලෙසින් ක්‍රියාත්මක වන මෙම ආයතනය මගින් කොටස් වෙළඳපළ තුළ සිදුවන සියළුම ගණුදෙනු පසුකාලීනව ස්වයංක්‍රියව සිදු කිරීම සඳහා පිහිටුවා ඇති ආයතනයකි.

සීමිත මධ්‍යම තැන්පතු ක්‍රමය මගින් ඉටුකරනු ලබන කාර්යයන් වනුයේ

* ගනුදෙනුකරුවන් ලියාපදිංචි කිරීම

* කොටස් තැන්පත් කිරීම

* කොටස් ආපසු ගැනීම

* කොටස් පැවරීම

* කොටස් නිෂ්කාශනය

* බේරුම් කිරීම

* හිමිකම් නිකුතු සම්බන්ධ පශ්චාත් ප්‍රතිලාභ අත්පත් කරදීම

## කොටස් තැරැව්කාර සමාගම්

සුරකුම්පත් විකිණීමේදී හා මිලදී ගැනීමේදී සියලුම අතරමැදි කාර්යයන් සිදුකරනු ලබන්නේ කොටස් තැරැව්කාර සමාගම විසින්ය. ඒ සඳහා කොටස් වෙළඳපළ තුළ සාමාජිකත්වය දරන තැරැව්කාර සමාගම් 15 ට අමතරව තැරැව්කාර සමාගම් රාශියක් මේ සඳහා ක්‍රියාකිරීමට ශ්‍රී ලංකා සුරකුම්පත් හා විනිමය කොමිසම තුළින් අනුමැතිය ලබාගෙන ඇත.

කොටස් තැරැව්කාර සමාගම් මගින් ඉටුකරනු ලබන කාර්යයන් වන්නේ

ආයෝජකයන්ගේ ගිණුම් ලියාපදිංචිකිරීම

වෙළෙඳපළ තොරතුරු සැපයීම

අතරමැදි සේවාවන්

පර්යේෂණ කටයුතු

ආන්තික ගනුදෙනු

## ශ්‍රී ලංකා සුරකුම්පත් හා විනිමය කොමිෂන් සභාව

ශ්‍රී ලංකා සුරකුම්පත් හා විනිමය කොමිෂන් සභාව කොළඹ ව්‍යාපාර වස්තු හුවමාරුවේ කටයුතු අධීක්ෂණය කිරීම හා විධිමත් කිරීම පිණිස පාර්ලිමේන්තු පනතක් යටතේ පිහිටුවා ඇති ආයතනයකි. කොමිසමෙහි පාලනය නිල බලයෙන් පත් වන සාමාජිකයන් ගෙන් හා පත්කළ සාමාජිකයන් ගෙන් සමන්විතය. උදාහරණ,

- නිල බලයෙන් පත් වන වරලත් ගණකාධිකාරී ආයතනයේ සභාපති
- සමාගම් රෙජිස්ට්‍රාර්
- මහා භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්

## අරමුණු / කාර්‍ර්යන්

1. සුරකුම්පත් විධිමත් හා සාධාරණ ආකාරයට නිකුත් කළ හැකි වූත් වෙළඳාම් කළ හැකි වූත් වෙළෙඳ පළක් බිහි කිරීම හා පවත්වාගෙන යාම

2. සුරැකුම්පත් වෙළෙඳපොළ විධිමත් කිරීම හා එහි වෘත්තිය ප්‍රමිතීන් පවත්වාගෙන යාම

3. ආයෝජකයන් ආරක්ෂා කිරීම

4. තැරැව්කරුවන් ගෙන් ආයෝජකයන්ට ඇති වන අසාධාරණකම් වලින් ඇතිවන අලාභ තුනී කිරීමට වන්දි අරමුදලක් පවත්වාගෙන යාම

කොළඹ කොටස් හුවමාරුවේ සුරැකුම්පත් ගනුදෙනු වන ක්‍රම

මෙහිදී වෙළෙඳ ගනුදෙනු සිදු වන ක්‍රම දෙකකි.

1. **ස්වයංක්‍රීය වෙළඳ ගනුදෙනු ක්‍රමය** ATS

අන්තර්ජාලය හරහා පරිගණකගත කරන ලද සාමාන්‍ය කොටස් අලවියට අදාළව ගනුදෙනු සිදු කෙරෙන විද්‍යුත් ක්‍රමය මෙසේ හඳුන්වනු ලැබේ. එනම් ගනුදෙනුව සිදුවන වේලාවේදී ම ක්‍රියාත්මක වන දෝෂවලින් තොර කාර්යක්ශම විනිවිද භාවයක් සහිත මෙම ක්‍රමය සාමාන්‍ය කොටස් වල ද්විතික වෙළඳ ගනුදෙනු සඳහා ක්‍රියාත්මක වන ක්‍රමයකි.

ATS මගින් ඉටුකරනු ලබන කාර්යයන්

* ගනුදෙනු පියවීම වේගවත්ව සිදු කිරීම

* කාල ප්‍රමුඛතාව ඇතිව මිල මත ඇනවුම් සම්මුඛ කිරීම අලෙවි වන කොටස් ප්‍රමාණයන් හා මිල පිළිබඳ තොරතුරු සැපයීම

* මිල දර්ශක අන්තර්ජාලය මගින් ඉදිරිපත් කිරීම සමාගම්වල ප්‍රකාශ

* පොරොත්තු ඇණවුම් පිළිබඳ විස්තර

* ගනුදෙනුකරුවන් පිළිබඳ තොරතුරු

2. **ණය සුරකුම්පත් වෙළඳ ක්‍රමය** DEX

සංස්ථාපිත සමාගම් වල හා රාජ්‍ය ණය සුරකුම්පත් අලෙවිය සඳහා නිර්මාණය කරන ලද ස්වයංක්‍රීය ක්‍රමයක් බව හා ලැයිස්තුගත සමාගම් වල සියලු ණයකර ගනුදෙනුද රජයේ භාණ්ඩාගාර බිල්පත් හා භාණ්ඩාගාර බැඳුම්කර වල ද්විතියික ගනුදෙනු සඳහා ෘැං මගින් පහසුකම් සලසා දෙනු ඇත.

DEX මගින් සපයනු ලබන සේවාවන්

* බාර දීමට එරෙහිව ගෙවීම් පියවීම්

* අන්තර්ජාලය හරහා යථා කාලයේ ද්‍රවශීලතා කළමනාකරණය ගැනුම් හා විකුණුම් ගනුදෙනු සඳහා පහසුකම් සැලසීම

* අන්තර්ජාලය හරහා වෙළඳපළ තොරතුරු හා පශ්චාත් වෙළඳ ගණුදෙනු පිළිබඳ තොරතුරු සැපයීම

* රජය සුරකුම්පත් පරිණත වීමෙන් පසු එකතුකරගැනීම

කොළඹ කොටස් හුවමාරුව තුළ සුරැකුම්පත්වල මිල ගණන් තීරණය වීම

සුරැකුම් පත් වල මිල තීරණය වන්නේ කොටස් සඳහා ඇති ඉල්ලුම හා සැපයුම මතය. ඒ අනුව කොටසක වටිනාකම තීරණය වීම කෙරෙහි බලපෑම් කරන ප්‍රධාන සාධක දෙකක් ඇත.

*අපේක්ෂිත ඉපයීම

*අවදානම

ඉහත සඳහන් අපේක්ෂිත ඉපයීම හා අවදානම අතර ප්‍රධාන කරුණු තුනක් මත රඳා පවතී

* ආර්ථික කරුණු

* ව්‍යාපාර ක්ෂේත්‍රයට බලපාන කරුණු

* සමාගමට සුවිශේෂී කරුණු

ආයෝජකයන් කොටස් තෝරා ගැනීමේදී සැලකිලිමත් විය යුතු කරුණු

* මිල ඉපයුම් අනුපාතය

* ආර්ථික සාධක වල අනුපාත

* දේශපාලන ස්ථාවරත්වය

* ව්‍යාපාරය ක්ෂේත්‍රයේ ඇති ආකර්ෂණය

* ව්‍යාපාර ක්ෂේත්‍රයෙන් සමාගමට ඇති ස්ථානය සමාගමේ මූල්‍ය තොරතුරු

**කොටස් වෙළඳපළ තුළ කොටස් වල මිල ගණන් හැසිරීමේ ස්වරූපය**
මිල ගණන් වල හැසිරීම් ස්වරූප දෙකකි

1. වෘෂභ වෙළඳපල (ඉමකක ජ්රනැඑ)

කොළඹ කොටස් වෙළඳපළ තුළ කොටස් වල මිල ගණන් ඉහළ යමින් පවතින වෙළඳපොල වේ. එහි කටයුතු කරන ආයෝජකයා ඉමකක සබඩ්ඊඑදර නම් වේ.

2. වලසා වෙළඳපල (ඉ‍ෑර ජ්රනැඑ)

කොටස් වෙළඳපළ තුළ කොටස්වල මිල ගණන් පහළ යමින් පවතින වෙළඳපොල වේ. මෙහි කටයුතු කරන ආයෝජකයා ඉ‍ෑර සබඩ්ඊඑදර නම් වේ.

**කොටස් වෙළඳපළ ක්‍රියාකාරිත්වය ඇගයීම**
කොටස් වෙළඳපළේ කාර්යසාධනය ඇගයීම සඳහා වෙළඳපොළ දර්ශක භාවිතා කරයි. මේ සඳහා ප්‍රධාන දර්ශක දෙකක් භාවිතා කරයි.

1. සියළු කොටස් මිල දර්ශකය

2' s and p sri lanka 20 දර්ශකය

3. මුළු ප්‍රතිලාභ දර්ශකය

4. ක්ෂේත්‍ර /ආංශික දර්ශකය

* සියලු කොටස් දර්ශකය

කොටස් වෙළඳපළේ ලැයිස්තුගත සමාගම් සියල්ලෙහිම සාමාන්‍ය කොටස් වල මිල ගනන් හි ඇතිවන උච්චාවචනයන් පෙන්නුම් කරන දර්ශකය සමස්ත මිල දර්ශකය නම් වේ. මිල දර්ශකය සැකසීමේදී 1985 වර්ෂය පාදක වර්ෂය ලෙස යොදා ගනී. මෙය ගණනය කරනුයේ,

සියළු කොටස් මිල දර්ශකය (වර්තමාන වෙළෙඳපොළ ප්‍රාග්ධනය/ පාදක වර්ෂයේ වෙළඳපළ ප්‍රාග්ධනීකරණය) ෆ 100

* s&p ශ්‍රී ලංකා 20 දර්ශකය

මෙය කොළඹ ව්‍යාපාර වස්තු හුවමාරුවේ එහි විශාලතම හා වඩාත්ම ද්‍රවශීල සුරකුම්පත් සැලකිල්ලට ගනිමින් සකසා ඇත. ්බා ච දර්ශකය ගණනය කිරීම සඳහා පිළිගත් ගෝලීය ක්‍රමවේදයන් පදනම් කරගනී. එම දර්ශකය ගණනය කිරීම සඳහා විශාලතම හා වඩාත්ම ද්‍රවශීල සමාගම් ලෙස තෝරා ගනු ලබන්නේ කොටස් ව්‍යාපාර වස්තු හුවමාරුවේ ලැයිස්තුගත කර ඇති සියලුම සාමාන්‍ය කොටස් සැලකිල්ලට ගනිමිනි. දර්ශකය ගණනය කිරීමේදී 2004 පාදක වර්ෂය ලෙසත්, පාදක අගය 1000 ලෙසත් සැලකිල්ලට ගැනේ. ඒ අනුව සියලුම ව්‍යාපාර ක්ෂේත්‍ර නියෝජනය වන ආකාරයේ සුරකුම් පත් 20 තෝරා ගැනීමේදී ප්‍රධාන නිර්ණායක කිහිපයක් සැලකිල්ලට ගනී.

* සමාගමේ ද්‍රවශීලතාවය

* සමාගමේ විශාලත්වය

* සමාගමේ මූල්‍ය මට්ටම

* ක්ෂේත්‍ර/ ආංශික දර්ශකය

කොටස් වෙළඳපළ තුළ ක්‍රියාත්මක වන ව්‍යාපාර ක්ෂේත්‍රය සඳහා වෙන් වෙන් වශයෙන් දර්ශක 20ක් වෙනම ගණනය කරන අතර එය අංශක මිල දර්ශක ක්‍රමය නම් වේ. එතුලින් එක් එක් ව්‍යාපාර ක්ෂේත්‍ර වල ක්‍රියාකාරීත්වය ඇගයීමට ලක් කළ හැක.

කො/ වෙ/පල දර්ශක වල ඇති වැදගත්කම

1. ආර්ථික ක්‍රියාකාරීත්වය පිළිබඳ යම් අවබෝධයක් ලැබිය හැකි වීම

2. ආර්ථිකය තුළ සමාගම්වල ක්‍රියාකාරිත්වය පිළිබද යම් අවබෝධයක් ලැබිය හැකි වීම

3. වෙනත් රටවල කොටස් වෙළෙඳපොළ තත්ත්වයන් සමග සංසන්දනය කළ හැකිවීම

4. ආයෝජන තීරණ ගැනීමේදී ආධාර කරගත හැකි වීම

A/L NOTE BOOK
All about AL Notes ready for GCE AL Examination

# DOWNLOAD

Notes

Short Notes

Unit Test Papers

Term Test Papers

**From**

↓

www.ALNoteBook.com

## Your Ultimate Resource for GCE A/L Notes and Study Guides

"The A/L notebook website is a dedicated online platform designed to provide comprehensive study materials and notes specifically tailored for students preparing for the General Certificate of Education Advanced Level (GCE A/L) examinations for free. The website offers a wide range of resources, including detailed subject notes, past exam papers, practice questions, and study guides. These materials cover various subjects and are curated by experienced educators to ensure they align with the curriculum and exam requirements."